සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / දෙවන වාරය - ජූලි මාසය - 2 සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වි. අසංක දේශප්‍රිය අබේරත්න.

## 23 ඒකකය - බෙදීම 2

දුවේ පුතේ අද ඔන්න මම තවත් අළුත් පාඩමක් අරන් ආවා. අද පාඩම ඔයාලා කවුරුත් කැමතිම පාඩමක් .....මොකක් ද? දන්නවා ද අද පාඩම තමයි බෙදීම පාඩම...එහෙම නම් පහතින් තියන ක්‍රියාකාරකම කරන්නකෝ....නිවසේ ඉන්න කවුරු හරි සහයට කතා කර ගනිමු.

ක්‍රියාකාරකම 1

- ගල් කැට/රබර් ඇට හෝ ගණන් කිරීමට හැකි ද්‍රව්‍ය 100 ක් සූදානම් කර ගන්න.පහත දක්වා ඇති ආකාරයේ සංඛ්‍යා පත් කිහිපයක් ද සකස් කර ගන්න.
- 20 | 18 | 26 | 30 | 35 | 44 | 51 | 55 | 57 | 66 | 70
- වරකට සංඛ්‍යාපත බැගින් ගෙන එහි සඳහන් වන සංඛ්‍යාවට අදාළව ගණන් කිරීමට සූදානම් කර ගත් ද්‍රව්‍ය වෙන් කර ගන්න.
- අනතුරුව ද්‍රව්‍ය ඇසුරින් සමානව දෙකට බෙදීමට හුරු වන්න.
- ඒ ආකාරයට එම සංඛ්‍යා පත් ඇසුරින් වෙන් කර ගත් ද්‍රව්‍ය සමානව ගොඩවල් 3 හා 4 වෙන් කර බලන්න.

ක්‍රියාකාරකම 2

- ඔබ පරිහරණය කරන පිටු 40 , පිටු 80 අභ්‍යාස පොත් දෙකක් ගන්න.
- එහි ඇති පිටු දෙකට වෙන් වන ස්ථානය තෝරා ගන්න.අනතුරුව පැති දෙකේම ඇති පිටු ගණන ගණන් කරන්න.
- දෙපස ඇති පිටු ගණන සමාන දැයි බලන්න. අසමාන නම් ඒ සඳහා බලපා ඇති හේතු වැඩිහිටියකු සමඟ සාකච්ඡා කරන්න.

3.<u>පහත දී ඇති සංඛ්‍යා දීර්ඝ ක්‍රමයට බෙදන්න.</u>

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2 | 2 | 0 | | | 3 | 2 | 8 | | | 4 | 4 | 0 | | | 3 | 3 | 6 | | | 4 | 4 | 6 |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

<u>2පහත දැක්වෙන ගැටළු විසඳන්න.</u>

1. පබළු 100 ක් දෙදෙනෙකු අතර සමානව බෙදා දුන් විට එක් අයෙකුට ලැබෙන පබළු ගණන සොයන්න._________

2. ටික් බෝල 85 ක් 4දෙනෙකු අතර සමානව බෙදා දුන් විට එක් අයෙකුට බෝල කීයක් ලැබේ ද ? _______ඉතිරි_____

3.ජේර ගෙඩි 75 ක් සමාන ව ගොඩවල් 3 වෙන් කළ විට එක ගොඩක ඇති ජේර ගෙඩි ගණන කීය ද?__________

4.පෙට්ටියකට සබන් කැට 4 බැගින් කැට 64ක් පෙට්ටි කීයක ඇසිරිය හැකි ද?________________

5.අභ්‍යාස පොත් 67ක් ඒක් අයෙකුට පොත් 3 බැගින් කීදෙනෙකුට බෙදා දිය හැකි ද?________________